# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,508 — 1965 සැප්තැම්බර් 17 වැනි සිකුරාදා — 1965.9.17**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

**(මෙහි වෙනම් කොටු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් කාණ්ඩවලට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | පිට |
|---|---|---|---|
| **අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය** | — | **ආණ්ඩුවේ නිවේදන** | 1353 |
| **අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය** | 1349 | **මිල පාලන දැන්වීම්** | — |
| **රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය** | — | **ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්** | — |
| **අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය** | 1351 | **ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා** | — |
| **වෙනත් පත් කිරීම් ආදිය** | 1352 | **ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ** | — |
| **රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය** | 1352 | **විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්** | 1355 |
| | | **"සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම්** | 1361 |


[සැලකිය යුතුයි.—(1) 1963 ජනවාරි සිට ජූනි දක්වා නිකුත් අංක 13,457 සිට 13,690 තෙක් ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළවේ.

(2) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසේ කුලී මෝටර් රථ සේවාවක් පැවැත්වීම සඳහා මගීන් ගෙනයාමේ අවසර පත් ඉල්ලීමේ අයදුම්පත් ලැයිස්තුවක් පළවේ.]

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1965 අංක 346**

අංකය: ඩී. 31/රෙක්ඩ්/1

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාරතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුනගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට කපිතාන්වරුන් වශයෙන් :—

ලුතිනන් (තාවකාලික කපිතාන්) සෝමසිරි වික්‍රමසිංහ, ල.ඉ.—1962 මැයි 2 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ජෝසප් ලුවී ක්‍රිස්චියන් කොරේරා, ල.කා.හ.—1962 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) චාමස් හිල්ටන් ප්‍රනාන්දු, ල.ස.ස.බ.—1962 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ෂර්ලි වික්‍රමසිංහ ජයසේකර, ල.යු.යු.බ.—1962 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) සින්නතම්බි ආනන්දසුන්දරම්, ල.පා.හ. (නි)—1962 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) වේදගෙ මැක්සිමස් හර්බර්ට් පෙරේරා, ල.පි.යා.ඉ.—1962 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) මුතුමෙරෙන්ඥ හොවර්ඩ් ධර්මසිරි, ල.යු.යු.බ.—1962 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ප්‍රැන්සිස් කැලිස්ටස් කොරේරා, ල.කා.හ.—1962 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ඕන්ලි ස්ටෙනිස්ලස් ද සොයිසා, ල.පා.හ. (නි)—1962 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) අසෝක රාජේන්ද්‍ර විජේතුංග දෙල්ගොඩ, ල.පා.හ. (නි)—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ඩග්ලස් ලින්සේ විජේසිංහ, ල.ඉ.—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) කන්දයියා චන්ද්‍රප්‍රගාසන්, ල.පා.හ. (නි)—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ජෝසප් රෙජී ඉමැනුවෙල් පරම්සෝති, ල.පා.හ. (නි)—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) සුමනසේකර ආරච්චිගේ බර්ට් ඩයස්, ල.පා.හ. (නි)—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) සිවනන්දන් අරුනාසලම්, ල.පා.හ. (නි)—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ගුණතිලක වඩු උපසිරි, ල.යු. පොදු සේ.බ.—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) කුවින්ටස් චන්ද්‍රා බටුවිටගේ, ල.යු.සේ.බ.—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ඔස්ටින් ෆ්‍රෙඩරික් හර්ෂල් ස්වේවී, ල.යු.යු.බ.—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ආරියරත්න ආරියප්පෙරුම, ල.පා.හ. (නි)—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) වල්ලගේ කෝලියවංස නානායක්කාර, ල.පා.හ. (නි)—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) හියු ෆ්‍රෙඩ් රූපසිංහ, ල.කා.හ.—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) සතියේන්ද්‍ර ප්‍රසන්න ඉලන්ගන් තිලක, ල.යු. පොලිස් හේ.බ.—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ග්‍රැන්විල් වික්ටර් ඇලපාත, ල.යු. පොදු සේ.බ.—1962 දෙසැම්බර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) මහනෙල් සාලි චිත්‍රා ද සිල්වා, ල.කා.හ.—1962 දෙසැම්බර් 10 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) වීරමුන්ඩගේ ආතර් ඩඩ්ලි ප්‍රනාන්දු, ල.යු.සේ.බ.—1963 මාර්තු 12 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) දයානන්ද විජයසිංහ, ල.පා.හ. (නි)—1963 මාර්තු 12 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ෆ්‍රෙඩ්රික් වයිට්, ල.ඉ.—1963 අප්‍රේල් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ටුවාන් මහමූර් රජුඩීන්, ල.පා.හ. (නි)—1963 ජූනි 18 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) දොන් සුමතී විජේසිරි කුරුප්පු, ල.ස.බ.—1963 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) හලිහිංග සිරිල් හෙන්රි පෙරේරා, ල.ඉ.—1963 ඔක්තෝබර් 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) සිරිපාල විජේතුංග, ල.ස.ස.බ.—1964 ජනවාරි 24 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) වදුගේ මිත්‍රරත්න වීරසූරිය, ල.ඉ.—1964 ජනවාරි 24 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ජෝන් රෙජිනෝල්ඩ් ස්ටැන්ලි ද සිල්වා, ල.ඉ.—1964 ජනවාරි 24 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ඒෂිත් චන්ද්‍රගුප්ත ප්‍රනාන්දු, ල.ස.බ.—1964 ජනවාරි 24 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) කුරුවිටගේ ෂර්ලි සරත් සිල්වා, ල.යු. පොදු සේ.බ.—1964 පෙබරවාරි 17 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) කීර්තිසිරි විජය බටුවන්තුඩාව, ල.ඉ.—1964 ජූනි 1 වෙනි දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) පලිලියගේ පක්ෂවීර, ල.පා.හ. (නි)—1964 ජූනි 1 වෙනි දින.

ලුතිනන් (තවකලික කපිතන්) කිංස්ලි ලියපෝල්ඩ් ද සිල්වා ජයවර්ධන, ල.ස.ස.බ.—1964 ජූනි 17 වෙනි දින.

ලුතිනන් (තවකාලික කපිතන්) තෝමස් රෝලෝ තිස්ස ජයතුංග, ල.පා.හ. (නි)—1964 ජූනි 17 වෙනි දින.

ලුතිනන් (තාවකලික කපිතන්) ප්‍රැන්සිස් සේවියර් රීලියන් රෙක්ස් ප්‍රනාන්දු, ල.කා.හ.—1964 ජූනි 17 වෙනි දින.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමතාංශයේ
ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් 11 දින,
කොළඹ දීය.

9-773

---

1965 අංක 347

අංක : ඩී./වීඒෆ්/2/ඒ (II)

## යුද්ධ හමුදුව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්

1965 ජනවාරි 1 වන දින සිට මේජර්වරුන් වශයෙන් :—

කපිතන් (තා/මේජර්) හෙන්රි එඩ්වර්ඩ් විලියම් සොලමන්ස්, ලං.පා.හ.

කපිතන් (තා/මේජර්) සේනක රණසිංහ, ලං.පා.හ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

ඇම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් 11 වැනිදා
කොළඹදී ය.

9-774

---

1965 අංක 348

අංකය : ඩී. 32/රෙක් ව්.

## රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලැබූ ආපසු පත්කිරීමක්

1965 සැප්තැම්බර් 2 වැනි දින සිට රාජකීය ලංකා නාවික හමුදාවේ කොමාන්ඩර් (සැ) පදවියට ආපසු පත්කිරීම :—

තාවකාලික කපිතන් (සැ) කෙනත් මෙව්ලනඩ් මාටිනස්, රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් 8 වෙනිදා,
කොළඹ දීය.

9-776

---

1965 අංක 349

අංකය : ඩී 33/රෙක්ට්.

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### උසස් කිරීම

ඔවුන්ගේ නම් ඉදිරියෙහි සඳහන් කර ඇති දිනයන් සිට ජලයිට් ලුතිනන්වරු වශයෙන්:—

| | | | |
|---|---|---|---|
| ජලයිං ඔපිසර් ෆ්‍රැන්සිස් එඩ්ගාර් කුරේ | (01107) | පොදු/නියමු | 65. 2.12 |
| ජලයිං ඔපිසර් ඇන්තනි මොරිස් ඩෙන්සිල් ප්‍රනාන්දු | (01117) | පොදු/නියමු | 65. 2.12 |
| ජලයිං ඔපිසර් හොලුපතිරගේ කීර්තිරාජා කල්දේරා | (01097) | පොදු/නියමු | 65. 2.12 |
| ජලයිං ඔපිසර් පොන්නම්පලම් ආරියරත්නම් | (01101) | මෙහෙයවීම්/ගුවන් | 64.10. 1 |
| ජලයිං ඔපිසර් ඉන්ද්‍ර හේමාල් ජයතිලක | (01109) | මෙහෙයවීම්/ගුවන් | 65. 4. 1 |
| ජලයිං ඔපිසර් රෙක්ස්වෙල් රාජකුමාර් රාමනාතන් | (01110) | කාර්මික ඉංජිනේරු | 65. 4. 1 |
| ජලයිං ඔපිසර් මුලප්පර් මොහමඩ් කලිඩ් | (01106) | උපකරණ | 65. 4. 1 |
| ජලයිං ඔපිසර් දයා නිහල් කලුගල | (01112) | උපකරණ | 65. 4. 1 |
| ජලයිං ඔපිසර් සුනිල් ලීලානන්ද ඒකනායක | (01111) | පාලන | 65. 4. 1 |
| ජලයිං ඔපිසර් එතල්බර්ට් හැඩන් ඔලමස් | (01104) | පාලන/රෙජිමේන්තු | 64.10. 1 |

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් 2 දින,
කොළඹ දීය.

9-775

අංකය : පිඑල්/ඊ. 4/59.

ඩී. බී. ඇල්ලේපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1965 සැප්තැම්බර් 20 වැනි දින සිට 23 වැනි දින දක්වා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ආදායම් පාලක නිලධාරින්ගේ කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා ගල්ගමුව, නිකවැරටිය, පත්තල, බිංගිරිය සහ හිරියාල පත්තුවේ ආදායම් පාලක නිලධාරින්ගේ කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/එච්. 5/56.

සී. බී. හුනුකුඹුර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඩබ්ලිව්. එම්. බුලංකුලම මහතා 1965 සැප්තැම්බර් 8 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තමන්කඩුව, කලාගම් පලාත උතුර සහ කලාගම් පලාත දකුණ ආදායම් පාලක නිලධාරින්ගේ කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා දකුණු හුරුළු පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/ඒ. 9/61.

ඒ. එම්. එම්. අලහුදීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. කුමාරනායගම් මහතා 1965 සැප්තැම්බර් 20 වැනි හා 21 වැනි දිනයන්හි, ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/ඩී. 12/64.

ඩබ්ලිව්. බී. දසනායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ශ්‍රී. පත්මනාදන් මහතා 1965 සැප්තැම්බර් 7 වැනි දින සිට 9 වැනි දින දක්වා, බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ-වියලුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා බුත්තල ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/එච්. 1/48.

ටී. එල්. ජේ. හඩ්ජි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. එස්. විජේසිංහ මහතා, 1965 සැප්තැම්බර් මස 11 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැළඩවිලි හත්පත්තුවේ හා ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සී. ඊ. ජයවර්ධන,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 සැප්තැම්බර් මස 9 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

9-726

---

# වෙනත් පත්කිරීම් ආදිය

**1965 අංක 351**

## ගැසට් නිවේදනය

අතිගරු අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව, එතුමා විසින්—

අංක. පා 4/සාම්/5/5.

1. විජයබාහු විජයසිංහ මහතා කොළඹ දිස්ත්‍රික්කයට අතිරේක වශයෙන් ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා ද සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

අංක. පා 4/සාම්/15/4.

2. අකුරටියගේ පච්ලිස් ද සිල්වා මහතා බලපිටිය දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

අංක. පා 4/සාම්/15/4.

3. ලියනාච්චි රිචේලිස් ද සිල්වා මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.9.13 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-777

---

**1965 අංක 352**

## ගැසට් නිවේදනය

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංක. පා 4/හමප 7/1.

1965 සැප්තැම්බර් 2 වෙනි දින සිට ගාලු දිස්ත්‍රික්කයේ වතුගෙදර සුළු නගර සභා සීමාව තුළ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් කළුදේව අයිනිස් ද සිල්වා මහතා පත්කර ඇත්තේය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.9.13 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-778

---

**1965 අංක 353**

## දැන්වීමයි

අමරජීව කිත්සිරිමෙවන් ප්‍රේමතිලක මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹදී ය.

9-555

---

**1965 අංක 354**

## දැන්වීමයි

ධම්දේව ජයසිංහ මහතා කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

9-653

---

# රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

**1965 අංක 355**

මෙහි පහත සඳහන් පත් කිරීම 1965.8.1 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත.

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වෙනි ශ්‍රේණියේ ලිපිකරු පී. ජී. අමරදාස මහතා බදුල්ල කාර්යාලයේ සේවය කරමින් බදුල්ල, මොනරාගල පාලන දිස්ත්‍රික්කයන්හි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ජෝ. හැ. රත්නායක,
වැ. බ. රෙජිස්ට්‍රාර් ජනරාල්.

1965 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දී ය.

9-571/1

---

**1965 අංක 356**

මෙහි පහත සඳහන් පත් කිරීම 1965.9.1 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත.

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වෙනි ශ්‍රේණියේ ලිපිකරු කේ. ඒ. කරුණාරත්න මහතා බදුල්ල කාර්යාලයේ සේවය කරමින් බදුල්ල, මොණරාගල පාලන දිස්ත්‍රික්කයන්හි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ජෝ. හැ. රත්නායක,
වැ. බ. රෙජිස්ට්‍රාර් ජනරාල්.

1965 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දී ය.

9-571/2

# ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඞී.—බී. 132/29

## රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සමාගම් ආඥාපනත

(283 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සමාගම් ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සමාගම විසින් සම්පාදිතව ඒ වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් ස්ථිර කරනු ලැබූ ව්‍යවස්ථාව.

හෙ. ජිනදාස සමරක්කොඩි,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 31 දින,
කොළඹ දී ය.

**ව්‍යවස්ථාව**

1892 ජූනි මස 17 වන දින අංක 5,147 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, කලින්, කල සංශෝධිත ව්‍යවස්ථා, "1 වන පරිච්ඡේදය—පොදු ව්‍යවස්ථා" යන ශීර්ෂය යටතේ එහි 10 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) සාමාජිකයකුගේ මරණය දැනුම් දීම ලැබී මාස දෙකක් ඇතුළත, කළමනාකාර කාරක සභාව විසින්, 8 වන ව්‍යවස්ථාව යටතේ සහ එහි විධිවිධාන සලසා ඇති ආකාරයට හිමිකම් ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ට මේ ව්‍යවස්ථාවේ (11) ඡේදයෙහි දක්වා ඇති ආකාරයට ගණන් බලනු ලබන ප්‍රදානයක් මරණ ප්‍රදාන අරමුදලින් ගෙවිය යුතුය :

එසේ වුව ද සාමාජිකයා සියදිවි නසා ගැනීමෙන් මැරුණ අවස්ථාවක, සාමාජිකයා විසින් ඔහුගේ යැපෙන්නන් පොහොසත් කිරීමේ කාර්යය සඳහා දිවි නසා නො ගන්නා ලද්දේ ය යි, යථා පරිදි පවත්වනු ලබන පරීක්ෂණයට පසු කළමනාකාර කාරක සභාව සෑහීමට පත්වුව හොත් පමණක් මරණ ප්‍රදානය ගෙවිය යුතු ය."

9-554

---

## 1946 සහ 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම සහ ස්වාධීනතා) රාජාඥා 55 (4) වැනි වගන්තිය යටතේ ආඥාව

1946 සහ 1947 ලංකා (ආණ්ඩුක්‍රම සහ ස්වාධිනතා) රාජාඥාවල 55(4) වැනි වගන්තිය යටතේ ආඥාවයි.

කොමාර ජයවර්ධන,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1965 සැප්තැම්බර් 5 වැනි දින,
කොළඹ දීය.

**ආඥාව**

දිස්ත්‍රික් විනිශ්චයකාරවරුන්ගේ, රික්වෙස්ට් කොමසාරිස්වරුන්ගේ සහ මහෙස්ත්‍රාත්වරුන්ගේ වැඩ බැලීම සඳහා පත්කිරීමේ බලය පහත සඳහන් සීමාවන්ට යටත්ව, ලේකම්තැන වෙත මෙයින් පවරනු ලැබේ :—

(1) වරකට දින හතකට වැඩි කාලයක් හෝ එක් මාසයකදී සාමූහික වශයෙන් දින හතකට වැඩියෙන් වැඩ බැලීමට පත්කිරීම් ලේකම්තැන විසින් කළ යුතු නොවේ.

(2) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව දින හතක් නිවාඩුව දීර්ඝ කිරීම ලේකම් තැන විසින් නොකළ යුතුයි. එතෙකුදුවුවත් හදිසි අසනීපයකදී හෝ වෙනත් හදිසි ඔනෑකමකදී කොමිෂන් සභාවේ අදහස් විමසා එහි අනුමැතිය ලබාගන්නා තෙක් එවැනි නිවාඩු දීර්ඝ කිරීමක් ලේකම් තැනට කළ හැක.

2. ගම්බද උසාවි සභාපතීන්ගේ වැඩ බැලීම් සඳහා පත්කිරීමේ බලය පහත සඳහන් සීමාවන්ට යටත්ව ලේකම් තැන වෙත මෙයින් පවරනු ලැබේ :—

(1) වරකට දින තිහකට වැඩි කාලයකට වැඩ බලන පත්කිරීම් ලේකම් තැන විසින් කළ යුතු නොවේ.

(2) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව දින තිහක නිවාඩුව දීර්ඝ කිරීම ලේකම් තැන විසින් නොකළ යුතුයි. එතෙකුදුවුවත් හදිසි, අසනීපයකදී හෝ වෙනත් හදිසි ඔනෑකමකදී කොමිෂන් සභාවේ අදහස් විමසා එහි අනුමැතිය ලබා ගන්නා තෙක් එවැනි නිවාඩු දීර්ඝ කිරීමක් ලේකම් තැනට කළ හැක.

3. මේ ආඥාවේ—

"කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවයි. "ලේකම්තැන" යනුවෙන් අදහස් කරන්නේ කොමිෂන් සභාවේ ලේකම්තැනයි.

9-568

---

ඇල්. ඞී. බී. 207/41.

## පඩිපාලක සභා ආඥාපනත

### 33 (1) (ආ) වගන්තිය යටතේ ආඥාවයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ II වන කොටස මේස් භාණ්ඩ සෑදීමේ කර්මාන්තයට අදාළ කරමින් ඒ ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කළ ආඥාවක් 1963 ඔක්තෝබර් 11 දින අංක 13,788 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති හෙයින් ද ;

ඉහත කී කර්මාන්තය සඳහා පඩිපාලක සභාවක් පිහිටුවමින් ඒ ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ කළ ආඥාව 1963 දෙසැම්බර් 27 දින අංක 13,870 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති හෙයින් ද ;

ඒ ආඥාපනතේ 20 වන වගන්තිය යටතේ මේස් භාණ්ඩ සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් නියම කළ යුතු සාමාන්‍ය අවම කාල මිම්මේ වේතන ප්‍රමාණය මේ දක්වා නියම කර නැති හෙයින් ද ;

කම්කරු, රැකිරක්ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීෆා මොහමඩ් වන මම ඒ ආඥාපනතේ 33 (1) (ආ) වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව, මේස් භාණ්ඩ සෑදීමේ කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් සඳහා සාමාන්‍ය අවම කාල මිම්මේ වේතන ප්‍රමාණයක් නියම කිරීම සඳහා කම්කරු කොමසාරිස් වරයාට මෙම ආඥාවෙන් බලය පවරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකිරක්ෂා හා නිවාස ඇමති.

1965 සැප්තැම්බර් මස 4 වැනි දින,
කොළඹ දීය.

9-569

---

## 1949යේ අංක 18 දරණ කාර්මික නිෂ්පාදන පනත

ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 166 වැනි පරිච්ඡේදය වන කාර්මික නිෂ්පාදන ද්‍රව්‍ය ආඥාපනතේ දෙවැනි වගන්තිය හා අර්ථ නිරූපණ අඥාපනතේ දෙවැනි ඡේදය යටතේ ගරු කර්මාන්ත හා ධීවර ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව එතුමා විසින් ඒ. එස්. නවරත්නරාජා මහතාගේ කාර්මික නිෂ්පාදන භාණ්ඩ පාලක ධුරය අවලංගු කර ඒ වෙනුවෙන් කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ සංවර්ධන අධ්‍යක්ෂ තැන්පත් සී. මයිල්වාගනම් මහතා නැවත නියෝගයක් කරන තුරු කාර්මික නිෂ්පාදන භාණ්ඩ පාලක ධුරයට පත් කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එස්. ජේ. වල්පිට,
කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් මස 2 වැනි දින,
කොළඹදීය.

9-558

---

## මිල පාලන පනත

(විවිධ භාණ්ඩ) මිල පාලක විසින් පනවනු ලැබ 1965 ජූලි 16 වැනි දින අංක 14,453 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ විදුලි පන්දම් බැටරි හා ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර බැටරි වල මිලට අදාළ වන ආඥාව වාණිජ සහ වෙළඳ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වෙනි වගන්තිය යටතෙහි මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඞී. ටී. ඊ. ඒ. ද ෆොන්සේකා,
ස්ථිර ලේකම්,
වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1965 සැප්තැම්බර් 2 දින,
කොළඹ.

9-563

---

## මිල පාලන පනත

(විවිධ භාණ්ඩ) මිල පාලක විසින් පනවනු ලැබ 1965 අගෝස්තු 2 වැනි දින අංක 14,469 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ඉලෙක්ට්‍රික් බල්බ් වල මිලට අදාළ වන ආඥාව වාණිජ සහ වෙළඳ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වෙනි වගන්තිය යටතෙහි මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඞී. ටී. ඊ. ඒ. ද ෆොන්සේකා,
ස්ථිර ලේකම්,
වාණිජ සහ වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1965 සැප්තැම්බර් 2 දින,
කොළඹ.

9-562

## කොළඹ නගර සභාවේ මහජනාධාර කාරක සභාව

141 වන පරිච්ඡේදයේ දරිද්‍ර නීති ආඥාපනතේ 12 වන ඡේදයේ (2) වන කොටස අනුව, සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ඉගත සඳහන් කාරක සභාවේ කටයුතු කිරීම සඳහා පහත නම් සඳහන් අයවලුන් 1966 මැයි මස 16 වන දිනින් අවසන් වන කාල සීමාවට එම කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කර ඇත. :—

1. එස්. කාසිම් මොහොමඩ් මහතා,
 246, දෙමටගොඩ පාර,
 මරදාන, කොළඹ 9.

2. අයිවර් ප්‍රනාන්දු මහතා,
 62, ග්‍රීන් ලේන්,
 කොටහේන,
 කොළඹ 13.

ජී. එදිරිවීර,
ස්ථිර ලේකම් වෙනුවට.

1965 සැප්තැම්බර් මස 13 දින දී,
සමාජ සේවා අමාත්‍යාංශය,
නො. 14, බාන්ස් පෙදෙස,
කොළඹ 7.

9-767

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

කම්කරු, රැකීරක්‍ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, 1954 අංක 37 දරන ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්‍ෂා හා නිවාස ඇමති.

1965 අගෝස්තු 21,
කොළඹදීය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ බත්තරමුල්ල ග්‍රාම සේවක වසමේ බත්තරමුල්ලේ පිහිටි බිලිබාන කනත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. ඒ. එච්. පිලිප්පයියා මහතා විසින් 64.9.6 වැනි දින සකස් කළ අංක 1972 දරණ සැලැස්මේ සඳහන් කැබැලි අංක ඒ 1 ඉසෙඩ් දරන පහත සඳහන් පරිදි මායිම් ඇති, පර්. 14.75 පමණ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටස :—

උතුරු නැගෙණහිරට : හෙට්ටි ආරච්චිගේ දොන් චාර්ලිස් මහතාගේ ඉඩම ;

දකුණු නැගෙනහිරට : පාර ;

දකුණු බස්නාහිරට : පාර ;

උතුරු බස්නාහිරට : "ඒ 1 වයි" ඉඩම.

9-551

---

## දැන්වීමයි

හලාවත අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ දෙමළ භාෂා වන්ගෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ප්‍රෙඩ්රික් තම්බයියා ප්‍රොක්ටර් මහතා විසින් නොතාරිස්වරුන් පිළිබඳ (පරිච්ඡේද අංක 107 දරණ) ආඥාපනතේ 22 (1) දරණ වගන්තිය යටතේ 1964 ක්වූ ජූලි මස 31 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ක්වූ අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

9-665

## දැන්වීමයි

පේදුරුතුඩුව-චාවකච්චේරි අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් වෛරමුත්තු සිතම්පරපිල්ලේ කාතිගේසු මහතා විසින් නොතාරිස්වරුන් පිළිබඳ (පරිච්ඡේද අංක 107 දරණ) ආඥාපනතේ 22 (1) දරණ වගන්තිය යටතේ 1965ක්වූ අගෝස්තු මස 2 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාර ගෙන තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965ක්වූ අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

9-664

---

ඇල්.ඩී.—බී. 7/58

## 1958 අංක 1 දරන කුඹුරු පනත

### අංක 38 ආ (1) දරන වගන්තිය යටතේ ආඥාව

1958 අංක 30, 1961 අංක 61 සහ 1964 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1958 අංක 1 දරන කුඹුරු පනතේ 38 "ආ" වගන්තියේ (1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගොවිජන සේවා කොමසාරිස්, ජෝසප් වැලන්ටයින් ෆොන්සේකා, වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත් පත්තුවේ මීවැව ගොවි කාරක සභාවේ විෂමාචාරය ඔප්පු කිරීමට ප්‍රමාණවත් කරුණු ඇතැයි සැහීමට පත්ව, මේ ආඥාවෙන් එකී ගොවි කාරක සභාව විසුරුවා හරිමි.

ගොවිජන සේවා කොමසාරිස්.

1965 සැප්තැම්බර් 8 දින,
කොළඹදී ය.

9-663

---

ඇල්.ඩී.—බී. 80/44.

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 20, 24 සහ 25 වන වගන්තිවලින් තමන්වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මීට යාව ඇති උපලේඛනයෙහි දැක්වෙන තීරණ කිරීමට තමන් අදහස් කරන බව දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව එම ආඥා පනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරයි.

යෝජිත මෙම තීරණයන්ට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතාවයන් 1965 සැප්තැම්බර් මස 30 දින දහවල් 12 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරුද්ධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් විය යුතුය.

එන්. එල්. අබයවීර,
දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක
සභාවේ සභාපති.

1965 සැප්තැම්බර් මස 2 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

#### I වන කොටස

**වැඩකරන සාමාන්‍ය දවසක් යන්නෙහි අර්ථ නිරූපණය (24 වන වගන්තිය)**

වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණන (ආහාර ගැනීමට හෝ විවේකය සඳහා පැයක් ද ඇතුළුව) පැය 9ක් විය යුතුය.

#### II වන කොටස

මෙහි පහත දැක්වෙන I වැනි තීරයේ සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන් II

වැනි තීරයේ අනුරූප සටහනෙහි දැක්වෙන වැටුප් ප්‍රමාණයන් අනුව විය යුතු ය :—

| I වැනි තීරය<br>කම්කරුවාගේ පංතිය | II වැනි තීරය<br>වැඩකරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු වැටුප් ප්‍රමාණය<br>රු. ශ. |
|---|---|
| (අ) වයස අවුරුදු 16කට නොඅඩු පිරිමි කම්කරුවකුට ... | 3.30 |
| (ආ) වයස අවුරුදු 15කට නොඅඩු ගැහැණු කම්කරුවකුට ... | 3.00 |
| (ඇ) ළමා කම්කරුවකුට ... | 2.50 |

ඉහත සඳහන් තීරණවල " ළමා කම්කරුවා " යන්නෙන් වයස අවුරුදු 16කට අඩු පිරිමි කම්කරුවෙක් හෝ වයස අවුරුදු 15කට අඩු ගැහැණු කම්කරුවෙක් අදහස් වේ.

## III වන කොටස

### අතිකාල ප්‍රමාණයන්

වැඩකරන සාමාන්‍ය දවසකට වැඩියෙන් වැඩ කරන එක් එක් පැයකට ගෙවිය යුතු අවම අතිකාල ප්‍රමාණය (කාලම්මමේ වැඩ සඳහා ගෙවනු ලබන අවම දෛනික වේතන ප්‍රමාණය 8න් බෙදා සොයා ගත යුතු) පැයකට ගෙවනු ලබන අවම වේතන ප්‍රමාණය :—

(අ) ඒ වැඩය පෙ. ව. 7ටත් ප. ව. 7ටත් අතර කරන ලද්දේ නම් පැයකට ගැනෙන ඒ අවම වැටුප් ප්‍රමාණයෙන් සියයට 25කින් ද,

(ආ) ඒ වැඩය ප. ව. 7ටත් පෙ. ව. 7ටත් අතර කරන ලද්දේ නම් පැයකට ගැනෙන ඒ අවම වැටුප් ප්‍රමාණයෙන් සියයට 50කින් ද,

වැඩිකරගත් ගණන විය යුතුය.

අතිකාල ප්‍රමාණය ගණන් බැලීමේදී—

(1) ශත භාගයකට අඩු ශතයේ කොටස ගණන් නො ගත යුතුය.

(2) ශත භාගය ඉරට්ට ගණන් ගන්නා අන්දමට, එනම් ඉතාම කිට්ටු ඉරට්ට ගණනට ගණන් ගත යුතු ය.

(3) ශත භාගයට වැඩි ශතයේ කොටස සම්පූර්ණ ශතයක් මෙන් සැලකිය යුතු ය.

## IV වන කොටස

### සතිපතා නිවාඩු (24 වන වගන්තිය)

සෑම සේවයකු විසින්ම තමා යටතේ සේවයෙහි යොදවාගෙන සිටින සියළුම කම්කරුවන්ට සෑම ඉරු දිනයක්ම සතිපතා නිවාඩු දිනය වශයෙන් දිය යුතුය. එසේ වුවද, පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව සේවයකු විසින් යම් කම්කරුවකු ඉරු දිනයක වැඩෙහි යෙදවිය හැකි ය :—

(1) වැඩකළ ඒ ඉරුදිනට, ඉක්බිතිවම එළඹෙන දින හය ඇතුළත දිනයක් එම කම්කරුවාට නිවාඩු දිනයක් වශයෙන් දිය යුතුය.

(2) එවැනි ඉරු දිනක—

(අ) (කෑමට හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව) පැය නවයක් කම්කරුවකු වැඩ කළ විට හෝ සේවයා වැඩ දීමට අපොහොසත් වීමේ හේතුවෙන් වැඩ කළ කාල සීමාව පැය නවයකට අඩු වූවිට වැඩකරන සාමාන්‍ය දවසකට ගෙවන අවම වැටුප් ප්‍රමාණය මෙන් එකහමාරක වැටුප් ප්‍රමාණයක් ඔහුට ගෙවිය යුතුය.

(ආ) වැඩකිරීමට අකමැතිවීමේ හේතුවෙන් (කෑමට හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව) පැය නවයකට අඩුවෙන් වැඩ කළ කම්කරුවකුට, ඔහු වැඩ කළ සෑම පැයකටම (සාමාන්‍ය වැඩකරන දිනක අවම වැටුප් ප්‍රමාණය අටෙන් බෙදීමෙන් නිශ්චය කරගත්) පැයක ප්‍රමාණය මෙන් එකහමාරක ප්‍රමාණයක් ගෙවිය යුතු ය.

(ඇ) (කෑමට හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව) පැය නවයකට වඩා වැඩ කළ කම්කරුවකුට පැය නවයකට වැඩි වූ එක් එක් පැය සඳහා (සාමාන්‍ය වැඩකරන දිනක අවම වැටුප් ප්‍රමාණය අටෙන් බෙදීමෙන් නිශ්චය කරගත්) පැයකට ගෙවන ප්‍රමාණය මෙන් දෙගුණයක ප්‍රමාණයක් ගෙවිය යුතුය.

(3) යම් කාල සීමාවක සතියේ නිවාඩු දිනයක වැඩ කළ යම් කම්කරුවකුට ගෙවිය යුතු පාරිශ්‍රමිකය පඩිපාලක සභා ආඥා පනතේ 2(ආ) වගන්තිය යටතේ එවැනි කාලසීමාවකට වේතන ගෙවිය යුතු නියමිත කාලය ඇතුළත ගෙවිය යුතුය.

9-560

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### අංක 138—කිරිඇල්ල මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත්කිරීම සඳහා වූ මැතිවරණය

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපේක්ෂකයකු වූ හි. ආ. ප්‍රේමරත්න මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1965 අප්‍රේල් මස 29 වැනි දින මා වෙත ලැබුණු බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හයමාසය තුළදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී රත්නපුර කච්චේරියේ මැතිවරණ කාර්යාලයේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71(1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
තේරීම්භාර නිලධාරි තැන,
අංක 138—කිරිඇල්ල මැතිවරණ කොට්ඨාශය.

1965 අගෝස්තු මස 26 වැනි දින,
රත්නපුර කච්චේරියේ මැතිවරණ කාර්යාලයේ දීය.

9-561

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1961 අංක 33 දරණ කෘෂි ද්‍රව්‍ය (නියමිත මිළ සහ වී පැහීම හා කෙටීමේ පාලනය) පණතේ 3 වැනි වගන්තිය යටතේ කරන නියෝගය

අංක 14,464 හා 1965.7.30 දින දරණ ආණ්ඩුවේ ගැසට් පතෙහි පළ කරන ලද 1965.7.20 දින දරණ දැන්වීමෙහි දක්වා ලද ජනවාරි සහ ජූනි මාසවලදී රතුඑණු සඳහා ගෙවනු ලබන අවතික මිළ ගණන් පහත සඳහන් ආකාරයට සංශොධනය කර ඇත.

| | රාත්තලක් | | හොන්ඩරයක් | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| ජනවාරි | 0 | 31 | 34 | 72 |
| මැයි සහ ජූනි | 0 | 28 | 31 | 36 |

ජේ. ඩී. ප්‍රනාන්දුසේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

1965 සැප්තැම්බර් 4 වැනි දින,
කොළඹදීය.

9-549

---

633

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනය

### ආඥාපනතේ (402 අධිකාරය) 74 වගන්තිය යටතේ විකිණීමේ දැන්වීමයි

ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනයේ (1956 ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 402 අධිකාරය) 71 වගන්තිය යටතේ කරගත් 1964.2.25 වෙනි දින ටෛම්ස් ඔෆ් සිලෝන් ප්‍රවෘති පත්‍රයේද, අංක 13,950 සහ 1964.2.14 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේද ප්‍රකාශ කරණ ලද යෝජනාව හේතුවෙන්, කොළඹ ජන බැංකුස් වන ඩෙරික් කොක් මහතා විසින් 1951.12.10 වෙනි දින සහතික කළ 276 අංකය දරණ උකස් ඔප්පුවෙන් කඩුගන්නාවේ පිළිමතලාවේ බෝංගේ වලව්වේ පදිංචි පිළිමතලව්වේ විජේසුන්දර රාජකරුණා නවරත්න බණ්ඩාරනායක මුදියාන්සේ රාළහාමිලාගේ බෝංගේ උඩහ වලව්වේ මද්දුම බණ්ඩා බෝංගේ යන අය විසින් විශේෂයෙන් ආයතනයට උකස්කළ එම ඔප්පුවේ උපලේඛනයේ සඳහන් දේපල රුපියල් හයදහස් හැත්තෑ අටක් සහ ශත විසිතුනක් (රු. 6,078.23) ක්ද 1963.10.25 වෙනි දින සිට විකුණන දින දක්වා ප්‍රතිශත 6 බැගින් රු. 5,859.57 ට අමතර පොලියද, වෙන්දේසි ගාස්තුද, අයකර ගන්නා පිණිස එකී උකස්කරයේ උපලේඛනයේ සඳහන් ඉඩම පිහිටි ස්ථානයේදී 1965.11.13 දින පස්වරු 3.30 ට සම්පූර්ණ කට්ටියක් වශයෙන් මහනුවර බලයලත් වෙන්දේසිකරු ලොයිඩ් සමරවික්‍රම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

හී. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

292, ගාලු පාර,
කොළඹ 3.
1965.8.30 වෙනිදා.

9-707/1

6331

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනය

**ආඥපනතේ (402 අධිකාරය) 64 වගන්තිය යටතේ නිවේදනයයි**

**මුරුතලාවේ දෙහිඅගේ පදිංචි වෙදරාළගෙදර මොහමද් ඉස්මයිල් මොහමද් හනීපා වෙතයැ.**

ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනයේ (1956 ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 402 අධිකාරය) 71 වගන්තිය යටතේ කරගත් 1964.2.25 වෙනි දින ටයිම්ස් ඔෆ් සිලෝන් ප්‍රවෘති පත්‍රයේද, අංක 13,950 සහ 1964.2.14 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේද පළකරණ ලද යෝජනාව හේතුවෙන්, කොළඹ ජන නොතාරිස් වන ඩෙරික් කොක් මහතා විසින් 1951.12.10 වෙනි දින සහතික කළ 276 අංකය දරණ උකස් ඔප්පුවෙන් කඩුගන්නාවේ පිලිමතලාවේ බෝංගේ වලව්වේ පදිංචි පිලිමතලව්වේ / විජේසුන්දර රාජ්කරුණා නවරත්න බණ්ඩාරනායක මුදියාන්සේ රාළහාමිලාගේ බෝංගේ උඩහ වලව්වේ මද්දුම බණ්ඩා බෝංගේ යන අය විසින් විශේෂයෙන් ආයතනයට උකස් කළ එම ඔප්පුවේ උපලේඛනයේ සඳහන් දේපළ රුපියල් හයදහස් හැත්තෑ අටක් සහ ශත විසිතුනක් (රු. 6,078.23ක්) ක්ද 1963.10.25 වෙනි දින සිට විකුණන දින දක්වා ප්‍රතිශත 6 බැගින් රු. 5,859.57ට අමතර පොලියද, වෙන්දේසි ගාස්තුද, අයකර ගන්නා පිණිස එකී උකස්කරයේ උපලේඛනයේ සඳහන් ඉඩම පිහිටි ස්ථානයේදී 1965.11.13 දින පස්වරු 3.30 ට සම්පූර්ණ කට්ටියක් වශයෙන් මහනුවර බලයලත් වෙන්දේසිකරු ලොයිඩ් සමරවික්‍රම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

හි. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

292, ගාලු පාර,
කොළඹ 3.
1965.8.30 වෙනිදා.

9-707/2

---

## කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශනය—1965 ජූනි 30 වනදයින් අවසන් වන දෙවන කාර්තුවේ ත්‍රෛමාසික වාර්තාව

(පදනම 1952=100)

| කාණ්ඩය සහ වර්ගය | මිම්ම | 1952 පදනම් වර්ෂයේ සාමාන්‍ය | | | 1965 අප්‍රේල් | | 1965 මැයි | | 1965 ජූනි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පාරිභෝගික ප්‍රමාණය | මිළ ශත | වැය අගය රු. | මිළ ශත | දර්ශන අංකය | මිළ ශත | දර්ශන අංකය | මිළ ශත | දර්ශන අංකය |
| I ආහාර ද්‍රව්‍ය | | | | **125.17** | | 106.54 | | 107.15 | | 106·69 |
| ධාන්‍ය | | | | **27.16** | | 64.44 | | 64.44 | | 64·44 |
| හාල්—සලාක | සේරු | *28.14 | 25 | 7.04 | 25 | — | 25 | — | 25 | — |
| හාල්—සලාකයෙන් පිට | සේරු | 7.37 | 87 | 6.41 | — | — | — | — | — | — |
| තිරිඟු පිටි | රා. | †30.77 | 23 | 7.08 | 23 | — | 23 | — | 23 | — |
| සකස් කළ භෝජන | | — | — | **8.24** | — | 107.64 | — | 107.64 | — | 107.64 |
| බීම වර්ග | | — | — | **20.43** | — | 126.82 | — | 127.17 | — | 127.12 |
| තේ—බී. ඕ. පී. | රා. | .08 | 222 | .18 | 242 | — | 244 | — | 245 | — |
| තේකුඩු | රා. | .57 | 200 | 1.14 | 193 | — | 199 | — | 187 | — |
| කෝපි ඇට | රා. | .28 | 310 | .87 | 337 | — | 351 | — | 328 | — |
| රතු සීනි | රා. | ‡10.47 | 50 | 5.24 | 63‡ | — | 63‡ | — | 63‡ | — |
| සුදු සීනි | රා. | ‡1.85 | 57 | 1.05 | 67‡ | — | 67‡ | — | 67‡ | — |
| කිරි (අමු) | බෝතලයක් | — | 78 | 2.42 | 60 | 76.92 | 60 | 76.92 | 60 | 76.92 |
| ඇකු කළ කිරි | ටින් | .88 | 100 | .88 | 107 | — | 108 | — | 111 | — |
| කිරි ආහාර | | — | — | 2.19 | — | 106.95 | — | 105.82 | — | 109.37 |
| කිරි පිටි | | — | — | .27 | — | 104.73 | — | 105.45 | — | 105.45 |
| කිරි තේ | කෝප්පයක් | — | 6 | 5.69 | 10 | 166.67 | 10 | 166.67 | 10 | 166.67 |
| ඊසිල් බීම | බෝ. දුසිමක් | — | 216 | .50 | 330 | 152.78 | 330 | 152.78 | 330 | 152.78 |
| කුළු බඩු | | — | — | **14.49** | — | 122.36 | — | 124.91 | — | 119.05 |
| වියලි මිරිස් | රා. | 2.11 | 128 | 2.70 | 131 | — | 131 | — | 135 | — |
| කොත්තමල්ලි | රා. | 1.32 | 63 | .83 | 55 | — | 51 | — | 52 | — |
| ලුණු | රා. | 9.53 | 6 | .56 | 7 | — | 7 | — | 7 | — |
| ගම්මිරිස් | රා. | .19 | 504 | .26 | 230 | — | 236 | — | 223 | — |
| කහ | රා. | .24 | 67 | .15 | 99 | — | 96 | — | 93 | — |
| සුදුළූනු | රා. | .30 | 106 | .41 | 100 | — | 109 | — | 105 | — |
| විනාකිරි | බෝ. | .25 | 68 | .17 | 74 | — | 76 | — | 76 | — |
| අබ | රා. | .35 | 71 | .25 | 204 | — | 199 | — | 205 | — |
| සරක්කු | | — | — | 2.22 | — | 167.76 | — | 175.00 | — | 161.31 |
| පියලි ඉඟුරු | රා. | §16 | 226 | — | 378 | 167.26 | 356 | 157.52 | 324 | 143.36 |
| සුදුරු | රා. | §47 | 124 | — | 274 | 220.97 | 294 | 237.10 | 267 | 215.32 |
| මහදුරු | රා. | §21 | 124 | — | 122 | 98.39 | 125 | 100.81 | 125 | 100.81 |
| උළුහාල් | රා. | §16 | 67 | — | 69 | 102.99 | 72 | 107.46 | 67 | 100.00 |
| සියඹලා | රා. | — | 34 | .43 | 79 | 232.35 | 81 | 238.24 | 65 | 191.18 |
| දෙහි | එකක් | 46.50 | 3.89 | 1.81 | 3.31 | — | 3.43 | — | 3.08 | — |
| උම්බලකඩ | රා. | 1.05 | 124 | 1.30 | 330 | — | 329 | — | 322 | — |
| රතු ළූණු | රා. | 4.00 | 46 | 1.84 | 34 | — | 31 | — | 33 | — |
| බොම්බයි ළූණු | රා. | 2.12 | 40 | .85 | 25 | — | 39 | — | 27 | — |

*1954 දෙසැම්බර් මස සිට ප්‍රමාණය සේරු 48·51කි.

†1954 දෙසැම්බර් මස සිට ප්‍රමාණය රා. 4·77 කි.

‡1963.11.20 දින සිට රතු සීනි අනුපාතික ප්‍රමාණයක් පමණක් දනට පවත්නා බඩුරැස්වැයේ සීනිවල වටිනාකමට ඇතුළත් කොට ඇත.

§ගුරුත්වයය. සියයට ගණන.

| කාණ්ඩය සහ වර්ගය | මිම්ම | 1952 පදනම් වර්ෂයේ සාමාන්‍ය | | | 1965—අප්‍රේල් | | 1965—මැයි | | 1965—ජූනි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පාරිභෝගික ප්‍රමාණය | මිළ ශත | වැය අගය රු. | මිළ ශත | දර්ශණ අංකය | මිළ ශත | දර්ශණ අංකය | මිළ ශත | දර්ශණ අංකය |
| ඇට වර්ග | | — | — | **2·29** | — | 98·14 | — | 100·13 | — | 96·05 |
| එළවළු සහ පළතුරු | | — | — | **14·28** | — | 108·26 | — | 116·81 | — | 123·81 |
| i කොටස (වාරයක් නැති) | | — | — | 3·93 | — | 155·22 | — | 166·16 | — | 157·76 |
| ii කොටස (පළා වර්ග) | | — | — | 1·52 | — | 151·32 | — | 146·71 | — | 161·84 |
| iii කොටස (වාරයට හට ගන්නා) | | — | — | 6·58 | — | 72·19 | — | 84·95 | — | 100·76 |
| අල වර්ග | | — | — | ·21 | — | 130·75 | — | 140·38 | — | 167·33 |
| අළුත් පළතුරු | | — | — | 2·04 | — | 100·00 | — | 100·00 | — | 100·00 |
| **මේද සහ තෙල් වර්ග** | | — | — | **2·98** | — | 133·33 | — | 135·51 | — | 130·80 |
| පොල් තෙල් | බෝ. | 3.17 | 87 | 2·76 | 116 | — | 118 | — | 114 | — |
| **විසිතුරු කෑම වර්ග** | | — | — | **·58** | — | 102·66 | — | 102·97 | — | 111·38 |
| වෙඬරු (බටර්) | රා. | *55 | 301 | — | 283 | 94·02 | 288 | 95·68 | 336 | 111·63 |
| ක්‍රාෆ්ට් කේජ් | ටින් | *6 | 168 | — | 390 | 232·14 | 375 | 223·21 | 373 | 222·02 |
| ජෑම්-මෙරට | ටින් | *10 | 141† | — | 229 | 162·41 | 228 | 161·70 | 224 | 158·87 |
| විස්කෝතු-(හන්ට්ලි හා පාමර්) ක්‍රීම් ක්‍රැකර්-මෙරට මැලිබන් | ටින් | *29 | 321† | — | 230 | 71·65 | 230 | 71·65 | 230 | 71·65 |
| මස් | | — | — | 7·72 | — | 112·34 | — | 111·70 | — | 114·01 |
| කටු සහිත හරක් මස් | රා. | *37 | 74 | — | 81 | 109·46 | 82 | 110·81 | 84 | 113·51 |
| කටු රහිත හරක් මස් | රා. | *32 | 88 | — | 96 | 109·09 | 96 | 109·09 | 98 | 111·36 |
| කටු සහිත එළු මස් | රා. | *20 | 200 | — | 236 | 118·00 | 228 | 114·00 | 230 | 115·00 |
| කටු රහිත එළු මස් | රා. | *11 | 227 | — | 275 | 121·15 | 268 | 118·06 | 276 | 121·59 |
| අළුත් මාළු සහ කරවල | | — | — | 20·62 | — | 114·89 | — | 110·91 | — | 107·61 |
| අළුත් මාළු | | — | — | 10·96 | — | 107·85 | — | 106.25 | — | 102·51 |
| කරවල | | — | — | 9·66 | — | 122·89 | — | 116·16 | — | 113·40 |
| අවශේෂ ආහාර ද්‍රව්‍ය | | — | — | **6·38** | — | 136·52 | — | 134·33 | — | 133·86 |
| පොල් | එකක් | 30·32 | 12·34 | 3·74 | 20.22 | — | 19.22 | — | 17.62 | — |
| පපඩම් | රා. | — | 86 | ·47 | 97 | 112·79 | 100 | 116·28 | 96 | 111·63 |
| බිත්තර | එකක් | 3·85 | 20 | ·77 | 24 | — | 24 | — | 25 | — |
| අර්තාපල් | රා. | 4·53 | 31 | 1·40 | 25 | — | 28 | — | 38 | — |
| ii. **ඉන්ධන හා ආලෝක** | | — | — | **8·67** | — | 102·31 | — | 101·61 | — | 103·69 |
| භූමිතෙල් | බෝ. | 12·94 | 18 | 2·33 | 17 | — | 17 | — | 17 | — |
| දර | හො. | 3·11 | 185 | 5·75 | 182 | — | 180 | — | 186 | — |
| ගිනිපෙට්ටි | එකක් | 12·67 | 3·5 | ·44 | 6·0 | — | 6·0 | — | 6·0 | — |
| විදුලි බලය | — | — | — | ·15 | — | 166·67 | — | 166·67 | — | 166·67 |
| iii. **ගෙවල් කුලී** | — | — | — | **11·52** | — | 101·53 | — | 101·53 | — | 101·53 |
| iv. **රෙදි පිළි** | — | — | — | **19·05** | — | 127·09 | — | 127·46 | — | 128·08 |
| ඇඳුම් කට්ටල රෙදි | — | *14 | — | — | — | 98·47 | — | 99·33 | — | 99·54 |
| කමිස රෙදි | — | *13 | — | — | — | 96·46 | — | 100·54 | — | 100·75 |
| සරොන් | — | *14 | — | — | — | 96·85 | — | 99·25 | — | 99·82 |
| කම්බා | — | *1 | — | — | — | 100·00 | — | 100·00 | — | 100·00 |
| වෙට්ටි | — | *2 | — | — | — | 97·80 | — | 98·85 | — | 104·35 |
| සාරි | — | *10 | — | — | — | 98·81 | — | 99·24 | — | 104·77 |
| මල් චීත්ත රෙදි | — | *17 | — | — | — | 100·01 | — | 100·85 | — | 99·48 |
| සුදු රෙදි | — | *8 | — | — | — | 100·79 | — | 101·34 | — | 99·34 |
| අමු රෙදි | — | *1 | — | — | — | 102·88 | — | 102·52 | — | 84·53 |
| බැනියන් | — | *3 | — | — | — | 98·95 | — | 96·99 | — | 105·64 |
| පට රෙදි | — | *12 | — | — | — | 97·32 | — | 102·11 | — | 100·64 |
| තුවා | — | *2 | — | — | — | 99·32 | — | 101·64 | — | 97·38 |
| ගෘහ රෙදි | — | *3 | — | — | — | 99·04 | — | 101·36 | — | 100·00 |
| v. **අවශේෂ ද්‍රව්‍යය** | — | — | — | **37·83** | — | 129·24 | — | 129·58 | — | 129·32 |
| බුලත් පුවක් | — | — | — | 3·75 | — | 94·48 | — | 98·95 | — | 90·49 |
| දුම් කොළ | — | — | — | 6·41 | — | 193·61 | — | 193·61 | — | 193·61 |
| හිස ආලේප සහ පවිත්‍රෝපකරණ | — | — | — | 5·5 | — | 147·09 | — | 146·51 | — | 150·27 |
| බෙහෙත් | — | — | — | 2·41 | — | 125·48 | — | 124·81 | — | 125·38 |
| මත්පැන් | — | — | — | 6·69 | — | 83·83 | — | 83·83 | — | 83·83 |
| ගෘහ භාණ්ඩ | — | — | — | 1·33 | — | 171·65 | — | 172·32 | — | 173·03 |
| ප්‍රවෘත්ති පත්‍ර | — | — | — | 1·21 | — | 147·22 | — | 147·22 | — | 147·22 |
| අධ්‍යාපනය | — | — | — | 2·19 | — | 89·95 | — | 89·50 | — | 89·50 |
| තැපැල් වියදම් | — | — | — | ·16 | — | 183·34 | — | 183·34 | — | 183·34 |
| ඇඳුම් පිරිසිදු කිරීම | — | — | — | 3·39 | — | 157·40 | — | 157·40 | — | 157·40 |
| ක්‍රීඩා සහ සමාජ ශාලා | — | — | — | ·15 | — | 100·00 | — | 100·00 | — | 100·00 |

* ගුරුත්ත්වය. සියයට ගණන.

† 1952 වර්ෂයේදී දී ඇත්තේ පිටරටින් ගෙන්වන අයි. එක්ස්. එල්. විගියේ අවුන්ස 24 ජෑම්ටින්වල සහ හන්ට්ලි සහ පාමර්ස් විස්කෝතුවලත් මිළය.

| කාණ්ඩය සහ වර්ගය | මිමම | 1952 පදනම් වර්ෂයේ සාමාන්‍ය | | | 1965—අප්‍රේල් | | 1965—මැයි | | 1965—ජූනි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පාරිභෝගික ප්‍රමාණය | මිළ ශත | වැය අගය රු. | මිළ ශත | දර්ශක අංකය | මිළ ශත | දර්ශක අංකය | මිළ ශත | දර්ශක අංකය |
| විනෝදය ... | — | — | — | 1·28 | — | 100·00 | — | 100·00 | — | 100 00 |
| ගමනා ගමනය ... | — | — | — | 3·81 | — | 99·37 | — | 99·37 | — | 99·66 |
| මුළු (බඩු රැස) වැය ... | — | — | — | 202·24 | — | — | — | — | — | — |
| දර්ශනාංකය (1952 සාමාන්‍ය මිළ =100) ... | — | — | — | — | — | 112· 3 | — | 112· 7 | — | 112·05 |

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඒ. ආර්. රත්නවේල්,
ජනලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂක.

9–614

## වතුපාරවල් ප්‍රසිද්ධ පාරවල්වලට පරිවර්තනය කිරීමේ පනත (ව්‍යවස්ථා අණපනත්—196 වැනි පරිච්ඡේදය)

වතු පාරවල් ප්‍රසිද්ධ පාරවල්වලට පරිවර්තනය කිරීමේ පනතේ (196 වැනි පරිච්ඡේදය) 2 වැනි වගන්තිය යටතේ මා වෙත පවරණ ලද බලතල අනුව කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති, හපුතන්තිරිගේ ලීලාරත්න ගුණසේකර වන මම මෙයින් නියෝග කර,

(අ) (i) මීට යාකොට ඇති දළ සැලැස්මේ ඒ.බී.සී. ඉරෙයෙන් සළකුණු කර, මෙහි දැක්වෙන උප ලේඛනයෙන් වඩාත් විස්තර කොට ඇති, කරඳුපොන-ඇපලාව වතු පාර ප්‍රසිද්ධ පාරක් විය යුතු බවද,

(ii) එම පාරේ මධ්‍යයේ සිට අඩි විසි පහක් ඇතුළත කොටස පළල් කිරීම, දික් කිරීම හෝ බෙදීම සඳහා මාර්ග ආරක්ෂිත බිම් තීරුවක් විය යුතු බවද,


(ආ) (අ) ඡේදයේ සඳහන් වතුපාර නඩත්තු කිරීමේ වගකීම, මෙම නියෝගය බලපාන වත්තේ අයිතිකරු හෝ අයිති කරුවන් වෙත පැවරෙන බවද, ප්‍රකාශ කර සිටිමි.

ලීල් ගුණසේකර,
කෑගල්ලේ පාලන දිස්ත්‍රික්කයේ
ආණ්ඩුවේ දිසාපති.

කච්චේරිය,
කෑගල්ල.
1965.3.22.

### උපලේඛනය

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ, කොළඹ-මහනුවර පාරේ 52/1 දරන බෝක්කුව අසලින් බෙදී ගොස්, අඹමඩල-ගල් අතර, ගම් කාර්ය සහා පාරට සම්බන්ධ වන, කරඳුපන සහ ඇපලාව වතුවල පිහිටි දිගින් සැතපුම් 6 ක් වූ වතුපාර .




9-666/2

## සමූපකාර සමිති පිළිබඳ ආඥාපනත (124 වෙනි අධිකාරය)

### සමූපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

සමූපකාර සමිති පිළිබඳ ආඥාපනතේ 52 (2) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමූපකාර සමිති ඒ එක එක ඉදිරියෙහි සඳහන්කර තිබෙන දිනයන්හි වසා දමන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|
| 1. සීමාසහිත විජය කුමාර පාලමේ සමූපකාර සුභ සාධක සමිතිය ... ... | 1965.8.2 |
| 2. සීමාසහිත මාඩුගොඩ සමූපකාර කඩ සමිතිය | 1965 8.3 |
| 3. සීමාසහිත කලේගාන සමූපකාර කඩ සමිතිය | 1965.8.10 |
| 4. සීමාසහිත බෙවර්ලිවත්ත සමූපකාර කඩ සමිතිය ... ... | 1965.8.13 |
| 5. සීමාරහිත මොටාංගෙදර සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය | 1965.8.13 |
| 6. සීමාසහිත ඕවිටිගම සමූපකාර කඩ සමිතිය | 1965.8.17 |
| 7. සීමාසහිත ශාන්ත ඇන්ඩෘස් මසුන් නිපද වීමේ හා අලෙවි කිරීමේ සමූපකාර සමිතිය ... ... | 1965.8.17 |
| 8. සීමාසහිත අවිස්සාවේල්ල සමූපකාර කඩ සමිතිය ... ... | 1965.8.17 |
| 9. සීමාසහිත යටිරාවන සමූපකාර කඩ සමිතිය | 1965.8.21 |
| 10. සීමාසහිත නාපාවල සමූපකාර කඩ සමිතිය | 1965.8.23 |
| 11. සීමාසහිත පිංවත්ත නාරන්පිටියාව සමූපකාර කඩ සමිතිය ... ... | 1965.8.31 |
| 12. සීමාසහිත බොරලුකඩ සමූපකාර කඩ සමිතිය | 1965.8.31 |

එච්. ඇස්. වනසිංහ,
සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්.

1965.9.9 වැනි දින,
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 419,
කොළඹ.

9-698

---

## දැන්වීමයි

උතුරුමැද පළාතේ පොලොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර, "කාලගාත්‍රා" නමැති රෝගය පැතිරී යන බැවි 1957තේ අංක 33 දරන (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) පනත සහ (සතුන්ගේ) බෝවෙන රෝග පිළිබඳ අඥාපනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය (470 වැනි පරිච්ඡේදය) යටතේ මා විසින් වර්ෂ 1965.7.30 දින අංක 14,464 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1965.9.6 වැනි දින,
පේරාදෙනියේ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේ දී.

9-566

---

## දැන්වීමයි

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර, "රක්තාශ්‍රව" නමැති රෝගය පැතිරී යන බැවි 1957තේ අංක 33 දරන (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) පනත සහ (සතුන්ගේ) බෝවෙන රෝග පිළිබඳ ආඥාපනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය (470 වැනි පරිච්ඡේදය) යටතේ මා විසින් වර්ෂ 1965.7.2 දින අංක 14,440 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1965.9.6 වැනි දින,
පේරාදෙනියේ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේ දී.

9-567

---

## දැන්වීමයි

### නු/ශ්‍රීධම්මෝදය පිරිවෙන, හඟුරන්කෙත

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ මාදන්වල පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියා පදිංචි කිරීමට මාදන්වල සුමනසාර ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත එම ඉල්ලීමට විරුද්ධතාවයන් ඇති නම් මා වෙත දැන්විය යුතුය.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ජී.ඇස්.පී.ඒ. 87
1965 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

9-621

---

## දැන්වීමයි

### ගා/ශ්‍රී සුමංගල පිරිවෙන, ඌරළ, වඳුරඹ, ගාල්ල

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ ඌරළ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස 1964.1.6 වෙනි දින සිට තාවකාලික වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

ඊ. එච්. ද අල්විස්.
අධ්‍යාපනඅධ්‍යක්ෂ

ජී. ඇස්. පී. ඒ. 115,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2,
1965.9.8.

9-622

---

## දැන්වීමයි

1958 අංක 29 දරණ සතුන් පිළිබඳ පනත යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පනවා ඇති අංක 13,406 හා 1962 නොවැම්බර් මස 29 වැනි දිනැති ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති නියෝගවල 12 වැනි නියෝගය යටතේ මහනුවර පාලන දිස්ත්‍රික්කය තුළ ගවයින් හංවඩු ගැසීම සඳහා පහත සඳහන් ස්ථානයන් හා දිනයන් එම පාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති වන වත්තගේ ජොහානිස් ප්‍රනාන්දු වන මම නියම කරමි.

1965 සැප්තැම්බර් 6 වැනි දින,
මහනුවර කච්චේරියේ දී ය.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
රජයේ දිසාපති මහනුවර.

මැදදුම්බර

| ග්‍රාම සේවක කොට්ඨාශයේ අංකය හා නම | හංවඩු ගැසීමේ ස්ථානය | දිනය | වේලාව |
|---|---|---|---|
| 184. ගලබොඩවත්ත ... | ග්‍රාම සේවක කාර්යාලය අසලදී ... | ... 1965.10. 2 ... | පෙ.ව. 8 සිට ප.ව. 6 දක්වා |
| | තුනිගස්ගල සමූපාකාරය අසලදී ... | ... 1965.10. 3 ... | එම |
| | කොටගහ තේ කර්මාන්තශාලාව අසලදී ... | ... 1965.10. 4 ... | එම |
| 185. වේරපිටිය ... | ග්‍රාමසේවක කාර්යාලය අසලදී ... | ... 1965.10. 2 ... | එම |
| | කරවිගහමඩගමේ අම්බලම අසලදී ... | ... 1965.10. 3 ... | එම |
| | ඇල්ලියද්දේ හොරකලාගේ කඩේ අසලදී ... | ... 1965.10. 4 ... | එම |

| ග්‍රාම සේවක කොට්ඨාශයේ අංකය හා නම | හංවඩු ගැසීමේ ස්ථානය | දිනය | වේලාව පෙ. ව. 8 සිට ප. ව. 6 දක්වා |
|---|---|---|---|
| 186. ගිඹඩව | වැල්ලේපහල වත්තේදී | 1965.10. 2 | එම |
| | බැබිලතැන්න වත්තේදී | 1965.10. 3 | එම |
| 187. ගිඹඩව වරදිවෙල | දෙල්ගස්තැන්නපිටිය (අමුණ) අසලදී | 1965.10. 2 | එම |
| | වරදිවෙල බෝලපිටිය (ධර්මදස කඩේ අසලදී) | 1965.10. 3 | එම |
| | දෙල්ගස්තැන්නපිටිය (අමුණ) අසලදී | 1965.10. 4 | එම |
| 188. වටපාන | ග්‍රාම සේවක කාර්‍යාලය අසලදී | 1965.10. 2 | එම |
| | දිවුල්ගහමඩ අම්බලම අසලදී | 1965.10. 3 | එම |
| | කුඹල්ඔළුව විවිධ සේවා කඩය අසලදී | 1965.10. 4 | එම |
| 189. කරල්ලියද්ද | මඩපොලගමේ පොල්වත්ත ඉඩම | 1965.10. 6 | එම |
| | කන්දවත්ත ස්ටෝරුව අසල | 1965.10. 7 | එම |
| | විල්අමුණගමේ සමාගම් ශාලාව අසල | 1965.10. 8 | එම |
| | මැදගම්මැද්ද අම්බලම අසල | 1965.10.10 | එම |
| 190. අළුත්වෙල | ගල්ඇනමුල්ල වත්ත | 1965.10. 6 | එම |
| | මැදවල ඉහල ගමේදී | 1965.10. 7 | එම |
| 191. උඩවෙල | බිම්පුස්සේ දිසානායක පොල්වත්ත | 1965.10. 6 | එම |
| | උඩවෙල මීගහගෙදර වත්ත | 1965.10. 7 | එම |
| | පහුරුගොල්ල වත්ත | 1965.10. 8 | එම |
| 192. රඹුක්වැල්ල | සියඹලගස්තැන්න නුගේ ලඟ පොල්වත්ත | 1965.10. 6 | එම |
| | දෙඩම්ගොල්ලේ බෝගහවත්ත | 1965.10. 7 | එම |
| | සදත්තෝදය පිරිවෙන අසල | 1965.10. 8 | එම |
| 203. වෙලපහළ | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10. 6 | එම |
| | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1957.10. 7 | එම |
| 204. උඩගම්මැද්ද | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10.10 | එම |
| | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10.11 | එම |
| 205. පල්ලේබාගේ | ඇඹලගම ග්‍රා. සං. සමිති ශාලාව අසල | 1965.10.10 | එම |
| | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10.11 | එම |
| | පුස්සැල්ලාගොල්ලෙ දී | 1965.10.12 | එම |
| 206. උඩබාගේ | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10.10 | එම |
| | මකුල්දෙනිය ග්‍රා.සං.ස. ශාලාව අසල | 1965.10.11 | එම |
| | දකුණු බලගහතැන්න ග්‍රා.සං.ස. ශාලාව අසල | 1965.10.12 | එම |
| 207. උඩිස්පත්තුව | ගොඩමුන්නේ කොස්ගස්තැන්න වත්ත | 1965.10.10 | එම |
| | නිල්ගල කොටුවේ වත්ත | 1965.10.11 | එම |
| | මහරවෙල ගම්බද උසාවියේ වත්ත | 1965.10.12 | එම |
| | රිලාමුල්ලේ මකුල්තැන්නේ වත්ත | 1965.10.13 | එම |
| 208. පොද්දල්ගොඩ | පොද්දල්ගොඩ රජයේ පාසල අසල | 1965.10.10 | එම |
| | කටුගොඩ රණවනගෙදර වත්ත | 1965.10.11 | එම |
| | දෙහිගස්හින්න අම්බලම අසල | 1965.10.12 | එම |
| | වෙළඳරාඩ දෙඩමගස්තැන්න ගෙදර අසල | 1965.10.13 | එම |
| | රංගල තේ කර්මාන්ත ශලාව අසල | 1965.10.14 | එම |
| | කංගප්පුව රජයේ බෙහෙත් හල අසල | 1965.10.15 | එම |
| | වටගල වත්තේ කාර්‍යාලය අසල | 1965.10.16 | එම |
| 209. කුරුකොහොගම | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10.19 | එම |
| | තැන්නේ කඩේ අම්බලම අසල | 1965.10.20 | එම |
| | හීල්ඔය පන්සල අසල කුඹුර | 1965.10.21 | එම |
| 210. රේටියගම | රීඩින්ග්‍රෝව් වත්තේ පැක්ටෙරිය අසල | 1965.10.19 | එම |
| | එක්කස්සේවත්ත ප්‍රසිද්ධ පාරේදී | 1965.10.20 | එම |
| | ලියන්ගපල වත්ත | 1965.10.21 | එම |
| | වැකලාව වත්තේ දෙමල පාසැල අසල | 1965 10 22 | එම |
| | හාතියල්වල අම්බලම අසල | 1965.10.23 | එම |
| | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10.24 | එම |
| 212. නමදගල | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10.19 | එම |
| | මාන්ගොඩ ප්‍රජා මණ්ඩල ශාලාව අසල | 1965.10.20 | එම |
| | උඩවෙල ප්‍රජාමණ්ඩල බෝලපිටිය | 1965.10.21 | එම |
| | පල්ලේ නදමල පන්සලේ වත්ත අසල | 1965.10.22 | එම |
| 213. දකුණු දෙරලියද්ද | දෙරලියද්ද පොල්ගහමුල්ල වත්ත | 1965.10.19 | එම |
| | අටුවගාව අස්වැද්දුම පිංවත්තේහේන | 1965.10.20 | එම |
| | රට්පේරකැලේ වත්ත, වැගල කොටස | 1965.10.21 | එම |

| ග්‍රාම සේවක කොට්ඨාශයේ අංකය හා නම | හංවඩු ගැසීමේ ස්ථානය | දිනය | වේලාව |
|---|---|---|---|
| 214. බෝමුරේ | ඌරුගල සංචාරක බංගලාපිටිය | 1965.10.19 | පෙ.ව. 8 සිට ප.ව. 6 දක්වා |
| | උඩතැන්න ඩිස්පැන්සරිය අසල | 1965.10.20 | එම |
| | දොරබෝමුරේ අමුණ අසල කුඹුර | 1965.10.21 | එම |
| 215. වතුලියද්ද | වතුලියද්දේ බෝගහපිටිය වත්ත | 1965.10.26 | එම |
| | හලියද්ද | 1065.10.27 | එම |
| | පූපුලේලන්ද වත්ත | 1965.10.28 | එම |
| 216. මහදෙරලියද්ද | මහදෙරලියද්ද දඹගස්තැන්න වත්ත | 1965.10.26 | එම |
| | ගොඩමඩතැන්න | 1965.10.27 | එම |
| | ගුරුඔය නාගොල්ල මිල්ලෑවේ ඉඩම | 1965.10.28 | එම |
| | දෙනිගල රබර් වත්ත | 1965.10.29 | එම |
| 217. අම්බාලේ | ග්‍රාම සේවක කාර්‍යාලය අසල | 1965.10.26 | එම |
| | ඇටඹවල බේකරිය අසල | 1965.10.27 | එම |
| | දියවැටෙන ඇල්ලේ කඳුර අසල | 1965.10.28 | එම |
| 218. දුනුවිල | ග්‍රාමසේවක කාර්‍යාලය අසල | 1965.10.26 | එම |
| | උඩවැව අසල | 1965.10.27 | එම |
| | වෙලේකුඹුර | 1965.10.28 | එම |
| | නැන්නෙලන්ද අම්බලම අසල | 1965.10.29 | එම |

9–615

## කොළරා—හයිද්‍රබෑඩ් වරාය

හයිද්‍රබෑඩ් වරාය කොළරා රෝගය පැතිර ඇති ප්‍රදේශයන් බවට ප්‍රකාශ කර තිබෙන බව මෙයින් සියලු දෙනාගේම දැනගැනීම පිණිස ප්‍රකාශ කරමි. එබැවින් ඉහත සඳහන් ප්‍රදේශයෙන් පැමිණෙන මගීන්ගෙන් කොළරා රෝගයට අත් එන්නත් කිරීමේ සහතිකයට අමතරව ලංකාවේ කිසියම් වරායක ගොඩබාන අළුත් මාළු, කටුවෙන් ආවරණවූ මාළු (ෂෙල් පිෂ්), එළවළු, පළතුරු, හකුරු, මස්කට් (එසේ නැතහොත් කොළරා රෝගය පැතිර යාමට අදාල වෙන වෙනත් ආහාර ද්‍රව්‍යයන්) ලංකාවට ගෙන ඒම තහනම් කර ඇත.

ඉහත සඳහන් ප්‍රදේශය කොළරා රෝගයෙන් තොරවූ වහාම තවත් දැන්වීමක් පළ කරනු ලැබේ.

අධ්‍යක්ෂ,
නිරෝධායන දෙපාර්තමේන්තුව.

නිරෝධායන කාර්යාලය,
කොළඹ, 1965.9.7.

9-656

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### බටහිර කොට්ඨාශය—කළුතර දිස්ත්‍රික්කය

වරාපිටිය-රිටිකැටිය පාරේ පිහිටි 2/2 පාලම අළුත්වැඩියා කිරීම සඳහා 65.8.29 වැනි දින සිට තවත් මාසයකට මෙම පාලම සියළු රථ වාහනවලට වසා තබනු ඇත. මේ කාලය තුළදී හොරණ-අළුත්ගම පාර ඔස්සේ වාහන යා හැක.

ඇන්. ජී. වික්‍රමසිංහ,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1965.9.13 දින,
කොළඹ.

9-772

## දැන්වීමයි

### ගා/ශාන්තිනිකේතන පිරිවෙන, රුකඩහේන, කහඳුව

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ රුකඩහේනේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස 1964. 1. 1 වෙනි දින සිට තාවකාලික වශයෙන් ලියා පදිංචි කළ බව මෙයින් දන්වමි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ජී.ඇස්.පී.ඒ. 103,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2,
1965.9.8 දින දී ය.

9-620

## "සුරාබදු ආඥපනත" පිළිබඳ දැන්වීම්

එල්. සී/බී—16/37
ඊ.සී. එල්සී/එස්/191

### අංක 544 දරන සුරාබදු නිවේදනය

#### සුරාබදු ආඥපනත

(52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥපනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සවදේශ කටයුතු පිළිබඳ ඇමති විජයානන්ද දහනායක වන මා විසින් 1965 සැප්තැම්බර් මස 17 වැනි දින සිට මෙම නිවේදනයෙන් කිතුල් ගසින් ලබාගන්නා නොපැසුණු (මී) රා, මුළු දිවයින තුළම සුරාබදු ආඥපනතේ විධිවිධානවලින් නිදහස් කරමි.

ඩී. දහනායක,
සවදේශ කටයුතු පිළිබඳ ඇමති.

කොළඹ,
1965.9.3.

9-652

ඊ.සී.එල්ජී/ජී/50

## 1965/1966 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි

### නිවේදනය අංක 1

1965 මැයි මස 28 වැනි දින හා අංක 14,407 දරණ ගැසට් පත්‍රයේ පලවූ 1965–66 වර්ෂය හා ඊටපසු කාල පරිච්ඡේදයන් සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවල 20 (1) දරණ කොන්දේසිය අනුව සුරාබදු කොමසාරිස්වර මුතු බණ්ඩා දිසානායක වන, මා වෙත පවරා ඇති බලතල අනුව—

(1) 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට මෙහි පහත සඳහන් පළමුවෙනි උපලේඛනයෙහි විස්තර කර ඇති අරක්කු වර්ග මෙහි පහත සඳහන් දෙවැනි උපලේඛනයෙහි සඳහන් රජයේ ගුදම්වලින් නිකුත් කළ වියයුතු බවද ;

(2) 1964 සැප්තැම්බර් මස 11 වැනි දින හා අංක 14,166 දරණ ගැසට්පත්‍රයෙහි පල වූ අංක 6 දරණ නිවේදනය 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට අවලංගු කළයුතු බව ද මෙයින් නිවේදනය කරමි.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්‍යාලය,
කොළඹ 6.
1965 සැප්තැම්බර් මස 3 දින.

### පළමු වෙනි උපලේඛනය

දෙවරක් පෙරූ අරක්කු වර්ගය
අති විශේෂ අරක්කු වර්ගය
ඉතා විශේෂ අරක්කු වර්ගය
සාමාන්‍ය අරක්කු වර්ගය
විශේෂ අරක්කු වර්ගය
ඉක්ෂුපාක අරක්කු වර්ගය

### දෙ වැනි උපලේඛනය

| ගුදම පිහිටි ස්ථානය | | පළාත්, දිස්ත්‍රික්කය හෝ සැපයෙන තැබෑරුම |
|---|---|---|
| කළුතර නගර හෝ මිරිස්සේන නියම කළ පරිදි | | 1. කොළඹ නගර සභාව |
| | | 2. කොළඹ දිස්ත්‍රික්කය, නගර සභාවෙන් පිට හා කැළණි ගඟෙන් දකුණ |
| | | 3. කළුතර දිස්ත්‍රික්කය |
| | | 4. ගාළු දිස්ත්‍රික්කය |
| | | 5. හම්බන්තොට දිස්ත්‍රික්කය |
| | | 6. රත්නපුර දිස්ත්‍රික්කය |
| මීගමුව | ... | 1. කොළඹ දිස්ත්‍රික්කය, නගර සභාවෙන් පිට හා කැළණි ගඟෙන් උතුර |
| | | 2. පුත්තලම දිස්ත්‍රික්කය |
| | | 3. හලාවත දිස්ත්‍රික්කය |
| | | 4. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කට්ටිමහන, දූනුකදෙනිය, යක්වල හා ගිරිඋල්ල අරක්කු තැබෑරුම |
| මහනුවර | ... | 1. මධ්‍යම පළාත |
| | | 2. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල, මාවතගම හා නාරම්මල අරක්කු තැබෑරුම |
| මඩකලපුව | ... | 1. මඩකලපුව දිස්ත්‍රික්කය |
| | | 2. අම්පාරේ දිස්ත්‍රික්කය |
| බදුල්ල | ... | ඌව පළාත |
| යාපනය | ... | යාපනය දිස්ත්‍රික්කය |
| වවුනියාව | ... | 1. වවුනියාව දිස්ත්‍රික්කය |
| | | 2. මුලතිව් දිස්ත්‍රික්කය |
| | | 3. මන්නාරම දිස්ත්‍රික්කය |
| ත්‍රිකුණාමල | ... | 1. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය |
| | | 2. අනුරාධපුර දිස්ත්‍රික්කය |

9–654/1

---

සු.කො.—එල්/ඒ/ඒ/50.

### 1965/66 වර්ෂය සඳහා වූ හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාව

**නිකුත් කරණ අවස්ථාවේදී අරක්කුවල සැර ප්‍රමාණය**

2 වැනි නිවේදනය

වර්ෂ 1965 මැයි මස 28 වැනි දිනය හා අංක 14,407 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1965/66 වර්ෂයට හා ඊටපසු කාල පරිච්ඡේදයන් සඳහා වූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 17 වැනි කොන්දේසිය යටතේ රජයේ ගුදමක් මගින් නිකුත් කරනු ලබන දෙවරක් පෙරූ අරක්කුවල සැර ප්‍රමාණය ඌන සම්මත 27° හා 29° සහ අති විශේෂ වර්ග, ඉතා විශේෂ වර්ග, සාමාන්‍ය වර්ග, විශේෂ වර්ග හා ඉක්ෂුපාක අරක්කු වර්ගවල සැර ප්‍රමාණය පිළිවෙලින් ඌන සම්මත 40 හා 42° විය යුතු බව සුරාබදු කොමසාරිස්වර මුතුබණ්ඩා දිසානායක වන මම මෙයින් නියම කරමි.

2. වර්ෂය 1964 සැප්තැම්බර් මස 11 වැනි දිනය හා අංක 14,166 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද 2 වැනි නිවේදනය 1965 ඔක්තෝබර් මස 1 වැනි දින පටන් අවලංගු වේ.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලය,
සැවෝයි ගොඩනැගිල්ල,
කොළඹ 6, 1965 සැප්තැම්බර් මස 3 දින දීය.

9–654/2

---

එල්.ඒ./ඒ/50

### 1965/66 වර්ෂයට හා ඊටපසු කාලපරිච්ඡේදයන් සඳහාවූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි

**3 වැනි නිවේදනය**

වර්ෂ 1965 මැයි මස 28 වැනි දින හා අංක 14,407 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද වර්ෂය 1965-66 හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 17 වැනි කොන්දේසිය මගින් හා වර්ෂ 1959 ජූලි මස 17 වැනි දින හා අංක 11,810 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක 482 දරන සුරාබදු නිවේදනයේ නියමාකාරයෙන් දක්වා ඇති අරක්කු තැබෑරුම් බල පත්‍රයේ 1 (බී) දරණ කොන්දේසියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සුරාබදු කොමසාරිස් මුතුබණ්ඩා දිසානායක වන මම,

(1) වර්ෂය 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට—

(i) මෙහි පළමුවැනි උපලේඛනයේ විස්තර කර ඇති අරක්කු වර්ග එම උපලේඛනයේම අදාල සටහන්වල දක්වා ඇති මිළ ගණන් අනුව තනි අයිතිය දනාය කළ තැනැත්තන්ට, රජය මගින් විකුණනු ලබන බව ; හා

(ii) තනි අයිතිය දනාය කළ තැනැත්තන් විසින්, එකී අරක්කු මෙහි දෙවැනි උපලේඛනයෙහි දක්වා ඇති මිළ ගණන් අනුව විකිණිය යුතු බැව්; හා

(2) 1965 සැප්තැම්බර් මස 11 වැනි දින හා අංක 14,166 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 3 දරණ නිවේදනය ;

වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට අවලංගු කරන බැව් ද මෙයින් නිවේදනය කරමි.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

කොළඹ සුරාබදු කොමසාරිස් කාර්යාලයේදී ය.
1965 සැප්තැම්බර් මස 3 වැනි දින.

### පළමුවැනි උපලේඛනය

**තනි අයිතිය දනාය කළ තැනැත්තන්ට රජය මගින් අරක්කු විකිණිය යුතු මිළ :—**

| වර්ගය | | | | ගැළුමක් රු. ශත |
|---|---|---|---|---|
| සාමාන්‍ය අරක්කු තොග වශයෙන් ... | ... | ... | ... | 42 0 |
| සාමාන්‍ය අරක්කු බෝතල් වල පුරවා ... | ... | ... | ... | 44 20 |
| විශේෂ අරක්කු බෝතල්වල පුරවා ... | ... | ... | ... | 44 20 |
| ඉක්ෂුපාක අරක්කු බෝතල්වල පුරවා ... | ... | ... | ... | 44 20 |
| ඉතා විශේෂ අරක්කු බෝතල්වල පුරවා ... | ... | ... | ... | 68 20 |
| අති විශේෂ අරක්කු බෝතල්වල පුරවා ... | ... | ... | ... | 68 20 |
| දෙවරක් පෙරූ අරක්කු බෝතල්වල පුරවා | ... | ... | ... | 92 20 |

## දෙවැනි උපලේඛනය

**I මුද්‍රා තැබූ බෝතල්වල පුරවා**

| (1) වර්ගය | (2) බෝතල් වර්ගය — රිපියුටඩ් ක්වාට් ගැළුමට බෝතල් 6යි — බෝතලයක රු. | ශත | ගැළුමකට සමාන මිළ රු. | ශත | රිපියුටඩ් පයින්ට් ගැළුමට බෝතල් 12යි — බෝතලයක් රු. | ශත | ගැළුමකට සමාන මිළ රු. | ශත |
|---|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය අරක්කු | 8 | 0 | 48 | 0 | 4 | 0 | 48 | 0 |
| විශේෂ අරක්කු | 8 | 0 | 48 | 0 | 4 | 0 | 48 | 0 |
| ඉක්ෂුපාක අරක්කු | 8 | 0 | 48 | 0 | 4 | 0 | 48 | 0 |
| ඉතා විශේෂ අරක්කු | 12 | 0 | 72 | 0 | — | | — | |
| අති විශේෂ අරක්කු | 12 | 0 | 72 | 0 | — | | — | |
| දෙවරක් පෙරූ අරක්කු | 16 | 0 | 96 | 0 | — | | — | |

**II ඩ්‍රෑම් බැගින්**

| (1) වර්ගය | (2) ඩ්‍රෑම් එකක් රු. | ශත | (3) ගැළුමකට සමාන රු. | ශත |
|---|---|---|---|---|
| (1) අවම මිළ—සාමාන්‍ය අරක්කු | 0 | 90 | 43 | 20 |
| (2) අවම මිළ—විශේෂ අරක්කු | 0 | 90 | 43 | 20 |
| (3) අවම මිළ—ඉක්ෂුපාක අරක්කු | 0 | 90 | 43 | 20 |
| (4) උපරිම මිළ—සාමාන්‍ය අරක්කු | 1 | 0 | 48 | 0 |
| (5) උපරිම මිළ—විශේෂ අරක්කු | 1 | 0 | 48 | 0 |
| (6) උපරිම මිළ—ඉක්ෂුපාක අරක්කු | 1 | 0 | 48 | 0 |

9—654/3

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නමට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. *ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.*

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි